# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2007/39 - 2017 පෙබරවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 24/51 (XII)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 158(2) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2017 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 02 දරන මෝටර් වාහන (ආරක්ෂක හිස්වැසුම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යතුරු පැදියක් පදවන හෝ යතුරු පැදියක රැගෙන යන සෑම තැනැත්තකුම සෑම විටම ආරක්ෂක හිස්වැසුමක් පැළඳිය යුතු ය.

3. ආරක්ෂක හිස්වැසුම -

(අ) සුරක්ෂිතව සවිවන පරිදි පළඳිනු ලැබිය යුතු ය ;

(ආ) නිකට පටියකින් සවිකරනු ලැබිය යුතු ය ; සහ

(ඇ) බාහිර පර්යන්ත දැක්මට බාධාවක් නොවන හා මුහුණ පෙදෙස නිරාවරණය වන, අඳුරු කරන ලද හෝ වර්ණ ගන්වන ලද ද්‍රව්‍යයකින් නිපදවනු නොලැබූ, මුහුණ ආවරණයක් සහිතව සවි කර තිබිය යුතු ය.

4. ආරක්ෂක හිස්වැසුමක්, එය පැළඳි විට එහි කිසිදු කොටසකින්, දිගුවකින් හෝ සම්බන්ධිතයකින් එය පැළඳ සිටින තැනැත්තාගේ මුහුණේ කිසිදු කොටසක් අපැහැදිලි වීමක්, සැඟවීමක් හෝ විකෘති වීමක් සිදු නොවිය යුතු ය.

5. ආරක්ෂක හිස්වැසුම සහ නිකට පටිය, එය වටා තියුණු දාර, තියුණු තුඩු, තියුණු මූට්ටු, මිටියම් ඇණ හෝ යතුරු ඇණ නොමැති තනි ඒකකයක් විය යුතු ය.

6. ආරක්ෂක හිස්වැසුමක වර්ණය, පැහැදිලිව පෙනෙන, බාහිර මතුපිටින් කිසිදු ආලෝක පරාවර්තනයක් සිදු නොවන, සියයට අනූවක් තනි වර්ණයකින් යුක්ත විය යුතු ය.

7. යතුරු පැදියක් පදවන තැනැත්තකු පළඳින හෝ භාවිතා කරන සෑම ආරක්ෂක හිස්වැසුමක් ම ශ්‍රී ලංකා ප්‍රමිති 517 : 1994 හෝ ආරක්ෂක හිස්වැසුම් සම්බන්ධයෙන් කලින් කළ අදාළ වන්නා වූ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

8. (1) යතුරු පැදි ධාවන තරඟයකදී යතුරු පැදි පැදවීම සඳහා හැර, යම් මාර්ගයක යතුරු පැදියක් පැදවීම සඳහා මෙම නියෝගවල විධිවිධානවලට අනුකූල නොවන යම් හිස්වැසුමක් භාවිතා කිරීම හෝ විකිණීම හෝ විකිණීම සඳහා අර්පණයක් කිරීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) යතුරු පැදි ධාවන තරඟයක් සඳහා යතුරු පැදියක් පදවන යම් තැනැත්තකු, අවශ්‍ය ආරක්ෂක ආම්පන්න ඇත්නම් මිස, තරඟ කිරීමක් සඳහා සහභාගී නොවිය යුතු ය.

9. 1991 ජනවාරි මස 11 වන දින අංක 644/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1990 මෝටර් වාහන (අනුමත කරන ලද ආරක්ෂක හිස්වැසුම්) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල :-

''නිකට පටිය'' යන්නෙන්, පැළඳ සිටින තැනැත්තාගේ හිස ගැටීමක දී හිස්වැසුම හිසෙහි රඳවා තැබීම අදහස් කෙරෙන, මිමී 20 කට වඩා පළලින් අඩු නොවන, පැළඳ සිටින තැනැත්තාගේ නිකට යටින් හෝ යටි හනුවට යටින් ගමන් කරන පටියක් අදහස් වේ ; සහ

''මුහුණ ආවරණය'' යන්නෙන්, පැළඳ සිටින තැනැත්තාගේ ඇස්වලට ඉහළින් ඉදිරියෙන් විහිදෙන්නා වූ සහ මුළු මුහුණම හෝ මුහුණෙහි කොටසක් ආවරණය වන්නා වූ විනිවිද පෙනෙන ආරක්ෂක මුවාවක් අදහස් වේ.

03 - 399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.